# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1768/36 - 2012 ජූලි මස 27 වැනි සිකුරාදා - 2012.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 1/2012.

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 29 වැනි වගන්තිය සමග කියවිය යුතු 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2012 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2012 කස මෝරා මසුන් ඇල්ලීම තහනම් කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකා ජල තීරය හෝ ගැඹුරු මුහුදේ ධීවර මෙහෙයුම්වල නිතර වන සහ ශ්‍රී ලංකා වරායන්වල මසුන් ගොඩබාන වරායක නැංගුරම්ලන කවර හෝ ධීවර බෝට්ටුවක් සම්බන්ධයෙන් මෙම නියෝග අදාළ වේ.

3. ධීවර මෙහෙයුම්වල යෙදී සිටින, විනෝදය හෝ ක්‍රීඩාවක් වශයෙන් මසුන් ඇල්ලීම සිදු කරන කිසිම තැනැත්තකු ඇලෝපිඩේ කුලයට අයත් (මින් මතු "කස මෝරා" යනුවෙන් හඳුන්වනු ලබන) කස මෝරා මත්ස්‍ය විශේෂ ඇල්ලීම නොකළ යුතු ය.

4. කිසිදු බෝට්ටු හිමියකු හෝ නියමුවකු අජීවී කස මෝරකුගේ සිරුරක් හෝ සිරුරක යම් කොටසක් හෝ බෝට්ටුව තුළ තබා ගැනීම, වෙනත් බෝට්ටුවකට මාරු කිරීම, ගොඩ බෑම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

5. (අ) අහඹු ලෙස අල්ලන ලද කස මෝරෙකුට ප්‍රායෝගිකව හැකි උපරිම තාක් දුරට යම් හානියක් නොකර මුහුදට මුදා හැරීම ; සහ


(ආ) කස මෝරකු අහඹු ලෙස අල්ලාගත් සහ සජීවීව මුදාහරින ලද අවස්ථා වාර්තාගත කිරීම සඳහා පවත්වාගන්නා ලොග් සටහන් පොතක එවැනි අවස්ථා සියල්ල පිළිබඳ වාර්තා තැබීම,

ධීවර බෝට්ටු හිමියකුගේ හෝ නියමුවකුගේ වගකීම වන්නේ ය.

6. කිසිම තැනැත්තකු විසින් කස මෝරා බෝට්ටුව තුළ තබා ගැනීම, වෙනත් බෝට්ටුවකට මාරු කිරීම, ගොඩ බෑම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.


7. ඇලෝපිඩේ කුලයට අයත් මත්ස්‍ය විශේෂයට මෙහි උපලේඛනයේ දක්වා ඇති ඇලෝපියස් වුල්පිනස් (කස මෝරා), අලෝපියස් සුපර්සලිඔසස් (ඇස් ගෙඩි කස මෝරා), අලෝපියස් පෙලජික් (පතුලේ වාසය කරන කස මෝරා) අයත් වේ.

Shedule (උපලේඛනය)




**Alopius vulpinus** (ඇලෝපියස් වුල්පිනස්)

Thresher shark Kasa Mora



**Alopius superciliosus** (ඇලෝපියස් සුපර්සලිඔසස්)

Bigeye Thresher shark Kasa Mora



**Alopius pelagicus** (ඇලෝපියස් පෙලජිකස්)

Pelagic Thresher shark Kasa Mora

8 - 434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.